# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2022.05.18

වර්ෂ 2022 ක් වූ මැයි මස 18 වන බදාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මැයි මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**මහා සභා රැස්වීම ආරම්භ වන විට සහභාගී වූ ගරු සභිකවරු**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
11. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
12. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
13. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
14. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා විසින් මහා සභා රැස්වීමේ වාර්තා තබන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම ඃ-**

**01. 2022-04-07 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් 2022-04-07 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත්, මහා සභා රැස්වීමේ වාර්තාවේ සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන ලෙසත් සභාව වෙතින් ඉල්ලීම් කරන ලදී.

2022-04-07 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සංක්ෂිප්ත වාර්තාවක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම මහා සභා රැස්වීම් වාර්තාව සහ මීට පෙර ඉදිරිපත් කරන ලද සංක්ෂිප්ත මහා සභා රැස්වීම් වාර්තා තමා හට පිළිගැනීමට නොහැකි බවට ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

(පෙ.ව 09.35ට ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, පෙ.ව 09.40ට ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා සහ ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, පෙ.ව 09.45ට ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා, පෙ.ව 09.50ට ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා පෙ.ව.10.00ට ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා සහ පෙ.ව 10.55ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

(පෙ.ව 11.45ට ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

2022-04-07 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන රහිතව බහුතරයෙන් සභා සම්මත විය.

**(පෙ.ව 11.50ට තේ පානය සඳහා කල් තබන ලද මහා සභා රැස්වීම පෙ.ව 12.05ට නැවත ආරම්භ කරන ලදී.)**

(තේ පානය සඳහා මහා සභා රැස්වීම කල් තබන ලද කාල සීමාව අතරතුරදී ගරු මන්ත්‍රී ටී.එච්. කුලරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන ඃ-**

කලේගාන වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත් සමාගම වන උදය කන්ස්ට්‍රක්ෂන් ආයතනය විසින් දැනට වෙළඳපොළෙහි ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම නිසා නව මිල ගණන් යටතේ සකස් කරන ලද ඇස්තමේන්තුවකට අනුව ඉදිරි සංවර්ධන කටයුතු සිදු කළ හැකි බවට දැනුම් දී ඇති බැවින්, ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමා වෙතින් ඉල්ලීමක් සිදු කොට ඇති බවත්, සිට්‍රස් වත්තේ ද්විත්ව කුටීර ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සිදු කරනු ලබන ආයතනය වෙතින් ගැටළු පැන නැගී නොමැති බවත්, දැනට ප්‍රාදේශීය සභාව මඟින් ආරම්භ කොට ඇති සංවර්ධන ව්‍යාපෘති නතර නොකරන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම. ඃ- නැත**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඃ- නැත**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා**

**01.** සංවර්ධන කටයුතු සඳහා ගිවිසුම් අත්සන් කොට ඇති නමුත් මෙතෙක් වැඩ ආරම්භ කොට නැති කර්මාන්තවල ගිවිසුම් අවලංගුකොට නව මිල ගණන් (රේට්ස්) යටතේ නැවත ඇස්තමේන්තු සකස්කොට එම කර්මාන්ත සිදු කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව සංවර්ධන කටයුතු සඳහා ගිවිසුම් අත්සන් කොට ඇති නමුත් මෙතෙක් වැඩ ආරම්භ කොට නැති කර්මාන්තවල ගිවිසුම් අවලංගුකොට නව මිල ගණන් (රේට්ස්) යටතේ නැවත ඇස්තමේන්තු සකස්කොට එම කර්මාන්ත සිදු කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**02.** කලේගාන සතිපොළ පැවති භූමියේ පැවති කඩ කාමර අබලන් තත්ත්වයට පත්ව තිබීම නිසා කඩ හිමියන් විසින් මාසික බදු මුදල් නොගෙවීම හේතුවෙන් කඩ කාමර අංක 01, 02, 03, 06, 08, 09, 10, 11, 12, 13, 15, 16 සහ 17 හි හිඟව පවතින රු.298,750.00 ක හිඟ බදු මුදල් සහ රු. 29,955.00 ක හිඟ දඩ මුදල් පොත් වලින් කපා හැරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාවට අදාළව කාලසීමාවක් සඳහන් කර නොමැති බවත්, මෙමගින් කඩ හිමියන් සඳහා අසාධාරණයක් සිදු නොවිය යුතු බවත්, ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

විගණන විමසුමක් අනුව මෙම හිඟ බදු මුදල් හා දඩ මුදල් පොත් වලින් කපා හැරීමට යෝජනා කළ බවත්, මෙම කඩ කාමර වලින් කිහිපයක් පමණක් පවත්වාගෙන ගිය බවත්, කඩ කාමර අංක 04,05,07 හා 14 මෙම යෝජනාවට අන්තර්ගත නොවන බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම යෝජනාව සම්බන්ධව ඇති ගැටළු පිළිබඳව සභාව දැනුවත් කිරීම සඳහා ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාවක් යෝජනා කරන ලද අතර එම යෝජනාව ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

<u>**කාරක සභා අවස්ථාව**</u>

කාරක සභා අවස්ථාවේදී ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්.අනිල් රංජන් මහතා පහත අදහස් දක්වා සිටින ලදී.

- සභාව සතු කඩකාමර වලින් ලැබිය යුතු බදු මුදල් පොත්වල ඉදිරියට ගෙන ඒම නිසා මෙම ගැටළුව පැන නැගී ඇති බව
- මෙම කඩකාමර හිමියන් සමග අප ප්‍රාදේශීය සභාව ගිවිසුම්ගත වී නොමැති බව
- මෙම ගැටළුව විගණන විමසුම් වලට ලක්ව ඇති බැවින් මෙම හිඟ බදු මුදල් සහ හිඟ දඩ මුදල් පොත් වලින් කපා හැරීමට යෝජනාව ඉදිරිපත් කරන ලද බව

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කාරක සභා අවස්ථාව අවසන් කිරීමට කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කඩ කාමර අබලන් තත්ත්වයක පැවති නිසා ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට නොහැකි පසුබිමක ගිවිසුම් අත්සන් නොකොට බදු මුදල් සහ දඩ මුදල් පොත්වල ඉදිරියට පවත්වාගෙන යන ලද්දේ ඇයි දැයි ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලද අතර මෙම යෝජනාව කඩ කාමර හිමියන්ට අසාධාරණයක් නොවන පරිදි සම්මත කර ගැනීමට සංශෝධනය කරන ලෙස ඉල්ලීම් කරන ලදී.

මෙම කඩ කාමරවලින් කිහිපයක් පමණක් පවත්වාගෙන ගිය බවත්, කඩ කාමර අබලන්ව පැවතීම නිසා ගිවිසුම් අත්සන් කිරීම සිදු නොකරන ලද බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ ඉල්ලීම අනුව මෙම යෝජනාව සුදුසු පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කලේගාන සතිපොළ පැවති භූමියේ පැවති කඩ කාමර අබලන් තත්ත්වයට පත්ව තිබීම නිසා ව්‍යාපාර පවත්වාගෙන යාමට නොහැකි වූ බැවින් කඩ හිමියන් විසින් මාසික බදු මුදල් නොගෙවීම හේතුවෙන් කඩ කාමර අංක 01, 02, 03, 06, 08, 09, 10, 11, 12, 13, 15, 16 සහ 17 හි හිඟව පවතින රු.298,750.00 ක හිඟ බදු මුදල් සහ රු. 29,955.00 ක හිඟ දඩ මුදල් පොත් වලින් කපා හැරීමට ලෙස මෙම යෝජනාව සඳහා සංශෝධනයක් ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

එම සංශෝධනය ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී සංශෝධිත යෝජනාවට අදාළව කලේගාන සතිපොළ පැවති භූමියේ පැවති කඩ කාමර අබලන් තත්ත්වයට පත්ව තිබීම නිසා ව්‍යාපාර පවත්වාගෙන යාමට නොහැකි වූ බැවින් කඩ හිමියන් විසින් මාසික බදු මුදල් නොගෙවීම හේතුවෙන් කඩ කාමර අංක 01, 02, 03, 06, 08, 09, 10, 11, 12, 13, 15, 16 සහ 17 හි හිඟව පවතින රු.298,750.00 ක හිඟ බදු මුදල් සහ රු. 29,955.00 ක හිඟ දඩ මුදල් පොත් වලින් කපා හැරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**03.** උළුවිටිකේ සන්සයිඩ් වත්තේ මාර්ග සහ කාණු පද්ධතිය සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ජේ.සී.බී යන්ත්‍රය යෙදවීම සඳහා සභා තීරණයක් අනුව සිදු කිරීම අත්‍යාවශ්‍ය කටයුත්තක් වන්නේද යනුවෙන් ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලද අතර පසුගිය දිනවල පැවති වර්ෂා තත්ත්වය නිසා නරාවල, කාසල්හිල් වත්තේ මාර්ගවලට හානි සිදුවූ බවද ප්‍රකාශ කරන ලදී.

හදිසි ආපදා තත්ත්වයන්වලදී සභා තීරණයක් නොමැතිව වුවද ජේ.සී.බී යන්ත්‍රය යෙදවීමට හැකියාව ඇති බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** **ඃ-** එකී යෝජනාවට අදාළව උළුවිටිකේ සන්සයිඩ් වත්තේ මාර්ග සහ කාණු පද්ධතිය සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය යොදාගෙන සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**04.** වටරැක නැගෙනහිර ප්‍රජාශාලාව සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හිදී පමණක් භාවිතයට ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කර ගැනීමට කරනු ලැබූ ඉල්ලීම අනුව පී. සම්පත් ඩයස් මහතා හට තවත් වසරකින් (2022-04-01 සිට 2023-03-31 දක්වා) එම ගිවිසුම දීර්ඝ කර ලබා දීමටත්, ගිවිසුම්ගත බදු මුදල රු.2,500.00 ක් කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** **ඃ-** එකී යෝජනාවට අදාළව වටරැක නැගෙනහිර ප්‍රජාශාලාව සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හිදී පමණක් භාවිතයට ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කර ගැනීමට කරනු ලැබූ ඉල්ලීම අනුව පී. සම්පත් ඩයස් මහතා හට තවත් වසරකින් (2022-04-01 සිට 2023-03-31 දක්වා) එම ගිවිසුම දීර්ඝ කර ලබා දීමටත්, ගිවිසුම්ගත බදු මුදල රු.2,500.00 ක් කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**05.** ගාල්ල, කලේගාන, වී.සී පාරේ, අංක 2/14 දරණ ලිපිනයේ පදිංචි ඩබ්.ඒ. ජයසිරි මහතාගේ ඉඩම ඉදිරිපිටින් යන මාර්ගය පළල් කිරීමේ කටයුතු සඳහා එම ඉඩමෙන් අඩි දෙකක ප්‍රමාණයක් ලබා ගැනීමට ඉල්ලීම් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය සඳහා අඩි දෙකක ප්‍රමාණය ලබා ගැනීමට සභාව මැදිහත්විය යුතු බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ දායකත්වය ලබාදිය යුතු බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** **ඃ-** එකී යෝජනාවට අදාළව ගාල්ල, කලේගාන, වී.සී පාරේ, අංක 2/14 දරණ ලිපිනයේ පදිංචි ඩබ්.ඒ. ජයසිරි මහතාගේ ඉඩම ඉදිරිපිටින් යන මාර්ගය පළල් කිරීමේ කටයුතු සඳහා එම ඉඩමෙන් අඩි දෙකක ප්‍රමාණයක් ලබා ගැනීමට ඉල්ලීම් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**06.** අප ප්‍රාදේශීය සභාවේ කාලේගාන ප්‍රධාන කාර්යාලයේ සී.සී.ටී.වී පද්ධතිය මගින් ආවරණය නොවන ස්ථාන සඳහා නව සී.සී.ටී.වී. කැමරා හයක් සවිකිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** **ඃ-** එකී යෝජනාවට අදාළව අප ප්‍රාදේශීය සභාවේ කාලේගාන ප්‍රධාන කාර්යාලයේ සී.සී.ටී.වී පද්ධතිය මගින් ආවරණය නොවන ස්ථාන සඳහා නව සී.සී.ටී.වී. කැමරා හයක් සවිකිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**07.** හපුගල, ඩාලින්ටන් වත්තේ, අතුරු මාර්ගයේ මැද කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය** **ඃ-** එකී යෝජනාවට අදාළව හපුගල, ඩාලින්ටන් වත්තේ, අතුරු මාර්ගයේ මැද කොටස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**08.** හපුගල, ආරච්චි කන්දේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය း-** එකී යෝජනාවට අදාළව හපුගල, ආරච්චි කන්දේ අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**09.** හපුගල, ඩාලින්ටන් වත්තේ, ඉහළ මාර්ගයේ මැද කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය း-** එකී යෝජනාවට අදාළව හපුගල, ඩාලින්ටන් වත්තේ, ඉහළ මාර්ගයේ මැද කොටස සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණියගේ යෝජනා**

**10.** උළුවිටිකේ, වලකඩවත්ත මාර්ගයේ කීර්ති මහතාගේ නිවස අසළින් ඇති කාණුව සහ මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

උළුවිටිකේ පන්සල අසල මාර්ගය කාපට් යොදා සංවර්ධනය කිරීමෙන් පසු පන්සල හරහා ගලා යන ජලය මෙම මාර්ගය හරහා ගලා බසින බවත්, මෙම ස්ථානයේ නිවසක් ඉදිකිරීම හේතුවෙන් බෝක්කුවක් අවහිර වී ඇති බවත්, එම නිසා මෙම ගැටළුව ඉක්මනින් විසඳා දෙන ලෙස ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය း-** එකී යෝජනාවට අදාළව උළුවිටිකේ, වලකඩවත්ත මාර්ගයේ කීර්ති මහතාගේ නිවස අසළින් ඇති කාණුව සහ මාර්ගය සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා**

**11.** ගොඩකන්ද, ඕකන්ද වත්ත මාර්ගයේ කාණුවට හියුම් පයිප්ප යොදා ජලය බැස යන පරිදි සකසා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය း-** එකී යෝජනාවට අදාළව ගොඩකන්ද, ඕකන්ද වත්ත මාර්ගයේ කාණුවට හියුම් පයිප්ප යොදා ජලය බැස යන පරිදි සකසා දීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**12.** ගල්කැටියවත්ත මාර්ගයේ දුම්මලදෙණිය ඕවිට, ගල්කැටිය පාර පිටවාන (ඇළ මාර්ගය) පිළිසකර කරදීමට ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත දන්වා යැවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය း-** එකී යෝජනාවට අදාළව ගල්කැටියවත්ත මාර්ගයේ දුම්මලදෙණිය ඕවිට, ගල්කැටිය පාර පිටවාන (ඇළ මාර්ගය) පිළිසකර කරදීමට ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත දන්වා යැවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**13.** උළුවිටිකේ, සන්සයිඩ් වත්තේ, පොදු ක්‍රීඩාංගනය අසළ පැති කාණුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන පිළිසකර කරදීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය විසින්ද මේ සඳහා පසුගිය සභා වාරයකදී යෝජනාවක් ඉදිරිපත් කොට තිබූ බවත්, එම ගම්වාසීන්ගේ සමිතිය මගින්ද මේ සඳහා ඉල්ලීමක් කොට තිබූ බවද, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව උළුවිටිකේ, සන්සයිඩ් වත්තේ, පොදු ක්‍රීඩාංගනය අසළ පැති කාණුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන පිළිසකර කරදීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**14.** කරාපිටිය, බෝගහවෙල්ල මාර්ගයේ වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට පස් යොදා සංවර්ධනය කිරීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය, ට්‍රැක්ටර් රථ සහ සේවකයින් යෙදවීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම ස්ථානයේ පැති බැම්මක් ඉදිකොට ඇති බැවින්, වාහන දෙකකට මාරු වීමේදී අපහසුතා ඇති බැවින්, පස් දමා මෙම ස්ථානය සංවර්ධනය කළ යුතු බවට, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, බෝගහවෙල්ල මාර්ගයේ වාහන දෙකක් මාරුවිය හැකි ආකාරයට පස් යොදා සංවර්ධනය කිරීමට සභාවේ ජේ.සී.බී යන්ත්‍රය, ට්‍රැක්ටර් රථ සහ සේවකයින් යෙදවීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**15.** කරාපිටිය, සන්සයිඩ් වත්තේ මාර්ගයට අවහිරව ඇති පස් තට්ටුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කාර්යය සිදු කිරීම සඳහා අදම දිනයක් ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, සන්සයිඩ් වත්තේ මාර්ගයට අවහිරව ඇති පස් තට්ටුව සභාවේ ජේ.සී.බී යන්ත්‍රය යොදාගෙන ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**16.** කරාපිටිය, නාවින්න සහ ගොඩකන්ද යන ග්‍රාමසේවා වසම්වල මේ වන විට ඩෙංගු රෝගීන් සිය දෙනෙකුට ආසන්න පිරිසක් ප්‍රතිකාර ලබන බැවින් එම ග්‍රාම නිලධාරි වසම්වල කාණු පද්ධති පිළිසකර කිරීමටත්, ඩෙංගු රෝගය මර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමටත් යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාව වන විට ඩෙංගු රෝගීන් සිය දෙනෙකු පමණ මෙම ප්‍රදේශවලින් වාර්තා වී සිටි බවත්, නාවින්න ග්‍රාම සේවා වසමේ පමණක් ඩෙංගු රෝගීන් හැට දෙනෙකු පමණ වාර්තා වූ බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

බල ප්‍රදේශයේ කොට්ඨාශවලට පවිත්‍රතා කටයුතුවලට සභාවේ සේවකයන් යොදවන අවස්ථාවලදී මෙම කටයුත්ත සිදු කිරීමට වග බලා ගන්නා ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කොට්ඨාශවල පවිත්‍රතා කටයුතු සඳහා සේවකයන් යෙදවීමේදී මේ සඳහා කටයුතු කළ නමුත්, එය ප්‍රමාණවත් නොවූ බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා ශ්‍රමදාන සංවිධානය කරන ලෙසත්, ඒ සඳහා සභාව මගින් ලබා දිය හැකි දායකත්වය ලබා දිය හැකි බවත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මෙම ප්‍රාදේශවල ඩෙංගු රෝගය තවදුරටත් ව්‍යාප්ත වීමට පෙර සභාව මගින් සිදු කළ හැකි කාර්යයන් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

කළුවගහ අද්දර කාණුවද දිගටම සුද්ධ පවිත්‍ර කළ යුතු බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

කළුවගහ අද්දර කාණුව එක්ස්කැවේටර් යන්ත්‍රයක් භාවිතා කොට සුද්ධ පවිත්‍ර කිරීමට අපහසුතා ඇති බවත්, කරාපිටිය ප්‍රදේශයේ ගෙන් ගෙට ඩෙංගු රෝගීන් සිටින බැවින්, මේ සඳහා සභාවේ අවධානය කඩිනමින් යොමු කරන ලෙස ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, නාවින්න සහ ගොඩකන්ද යන ග්‍රාමසේවා වසම්වල මේ වන විට ඩෙංගු රෝගීන් සිය දෙනෙකුට ආසන්න පිරිසක් ප්‍රතිකාර ලබන බැවින් එම ග්‍රාම නිලධාරි වසම්වල කාණු පද්ධති පිළිසකර කිරීමටත්, ඩෙංගු රෝගය මර්ධන වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීමටත් මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**17.** හිරිඹුර, ගැමුණු මාවත සහ බද්දේගම ප්‍රධාන මාර්ගය යා කරන අතුරු මාර්ගය පිළිසකර කොට මහජනතාවට ගමන් කළ හැකි ආකාරයට සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය අඩි හතරක පමණ පළල ඇති මාර්ගයක් බවත්, එය පිළිසකර කිරීම සිදු කළ යුතු බවත්, ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව හිරිඹුර, ගැමුණු මාවත සහ බද්දේගම ප්‍රධාන මාර්ගය යා කරන අතුරු මාර්ගය පිළිසකර කොට මහජනතාවට ගමන් කළ හැකි ආකාරයට සංවර්ධනය කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**18.** කරාපිටිය, ගොඩකන්ද මාර්ගය ආරම්භක ස්ථානය ආසන්නයේ මාර්ගයට අනතුරුදායක ලෙස දිරාපත්ව ඇති අඹ ගස සහා අරමුදලෙන් කපා අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගියවර සභාවේදී මේ සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ බවත්, එහි කපා ඉවත් කළ යුත්තේ කොට්ටම්බා ගසක් ලෙස සඳහන් කළද, දිරාපත්ව පවතින්නේ එම ස්ථානයේ ඇති අඹ ගස බැවින්, එම අඹ ගස කපා අනතුරුදායක තත්ත්වය ඉවත් කළ යුතු බවට ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව කරාපිටිය, ගොඩකන්ද මාර්ගය ආරම්භක ස්ථානය ආසන්නයේ මාර්ගයට අනතුරුදායක ලෙස දිරාපත්ව ඇති අඹ ගස සහා අරමුදලෙන් කපා අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ප.ව 12.30ට ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා**

**19.** දඩල්ල, වාළුකාරාම පන්සල අසළින් ඇති රසිකා මහත්මියගේ සහ තවත් නිවාස කිහිපයකට ගමන් ගන්නා මාර්ගය ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින් වටරක කොඩිතුවක්කු ගාර්ඩන්ස් වෙන්දේසි ඉඩමේ අප ප්‍රාදේශීය සභාව සතු භූමියේ ගොඩ ගසා ඇති පස් යොදාගෙන එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථයක් යෙදවීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා තමා විසින් පසුගිය සභාවාරවලදී යෝජනා කිහිපයක්ම ඉදිරිපත් කළ නමුත් මෙම මාර්ගයේ ඇති ගැටළුකාරී තත්ත්වයන් නිසා එය සිදු කර ගැනීමට නොහැකි වූ බවත්, මෙම මාර්ගයේ ජලය ගලා බැසීම සඳහා යෙදීමට ගෙන එන ලද සිලින්ඩර් මාර්ගය එරීමට ලක් වන නිසා අදාළ ස්ථානවලට යෙදීමට නොහැකි වූ බවත්, එබැවින් මෙම මාර්ගය පස් යොදා සංවර්ධනය කළ යුතු බවට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම මාර්ගයට යෙදීම සඳහා පස් කපා ගැනීමට හැකි ස්ථානයක් සොයා තමා වෙත දැනුම් දෙන ලෙසත්, එවිට එම මාර්ගය සංවර්ධනය කර ගැනීමට හැකියාව ඇති බවටත්, ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**සභා සම්මුතිය ඃ-** එකී යෝජනාවට අදාළව දඩල්ල, වාළුකාරාම පන්සල අසළින් ඇති රසිකා මහත්මියගේ සහ තවත් නිවාස කිහිපයකට ගමන් ගන්නා මාර්ගය ගමන් කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බැවින් වටරැක කොඩිතුවක්කු ගාර්ඩන්ස් වෙන්දේසි ඉඩමේ අප ප්‍රාදේශීය සභාව සතු භූමියේ ගොඩ ගසා ඇති පස් යොදාගෙන එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සභාවේ ජේ.සී.බී යන්ත්‍රය සහ ට්‍රැක්ටර් රථයක් යෙදවීමට මහා සභාව විසින් ඒකමතිකව සභා සම්මත කරන ලදී.

**(ඊ) කාරක සභාවල වාර්තා ඃ-**

**01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව ඃ-**

**I.** 2022-04-07 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**II.** 2022-04-22 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව ඃ-**

**I.** 2022-04-22 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව ඃ- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව ඃ- නැත**

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

2022 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

2022 වර්ෂයේ අප්‍රේල් මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

ඉහත වාර්තාව ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාවට යෝජනා කිරීමෙන් පසු ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

(ප.ව 12.45ට ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**04. වෙනත් ලේඛන** ඃ- නැත

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**2022 වර්ෂයේ මැයි මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.**

නව රේට්ස් පැමිණ ඇති බැවින් පසුගිය කාල සීමාව තුළ දී සිදු කර ගැනීමට නොහැකි වූ සංවර්ධන කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බවත්, වටරැක කළුපහන පාරේ බෝක්කුව සංවර්ධනය කිරීම සඳහා නව ඇස්තමේන්තුවක් සකස්කළ බවත්, ඒ සඳහා රුපියල් ලක්ෂ නමයක පමණ මුදලක් වැයවන බවටත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීම නව රේට්ස් අනුව සිදු කරදෙන ලෙස ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.

එම පැති බැම්ම ඉදිකිරීමේ කටයුතු සඳහා නව ඇස්තමේන්තුවක් සකස්කොට සිදු කරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

සේනානායක මහතා විසින් ප්‍රවේශ මාර්ගයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් කොට ඇති බවත්, ඒ සඳහා තමා වෙතද ලිපියක් ලබා දී ඇති බවත්, මේ පිළිබඳව ජනාධිපතිතුමා වෙතද ලිපියක් යොමුකොට ඇති බවටත් ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

එම මාර්ගය ලබාදීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකළ යුතු බවත්, එම කාර්යය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදුකළ යුතු බවත්, මෙම ගැටළුව වසර 10ක පමණ කාලයක තිස්සේ පවතින බවත් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

අසනීප හේතුවෙන් ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා හට අද දින මහා සභා රැස්වීමට සහභාගිවිය නොහැකි බවට දැනුම් දී ඇති බැවින් එතුමා හට නිවාඩු අනුමත කිරීමට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගොඩකන්ද ප්‍රදේශයේ බෝක්කුවක් සහා අරමුදලින් සංවර්ධනය කිරීම සඳහා සභාවට ඉල්ලීමක් ලැබී තිබේද යනුවෙන් ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා විසින් ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා වෙතින් විමසීම් කරන ලදී.

ඒ පිළිබඳව තාක්ෂණ නිලධාරි වෙතින් විස්තර ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදුකරන බවට ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

**<u>මහා සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ගරු සභිකවරු</u> ඃ-**

**I.** ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2022-06-15 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීමේ කටයුතු ප.ව 12.55 ට අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.